ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2006

පවුල් නීතිය - **LWU 2313**

කාලය - විනාඩි හතලිහයි.

---

දිනය - 2006.09.04 වේලාව - ප.ව.03.00 - ප.ව.03.40 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*
*එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.*

01. "කිසියම් ලිපියක හෝ ලියවිල්ලක භාෂාවෙන් විවාහ වීම සඳහා පොරොන්දුවක් අවශ්‍යයෙන්ම ගම්‍ය වන්නේ නම් එය ව්‍යවස්ථාවේ අර්ථයට අනුව පොරොන්දුවක් වේ."
-<u>කුරේ</u> එ. <u>කුරේ</u> (1928) 30 න.නී.වා.310 නඩුවේ දී ෆිෂර් අග විනිසුරු 313 පිටුවේ දී.

මෙම අධිකරණ වාචිකය මගින් විවාහ පොරොන්දු කඩ කිරීම පිළිබඳ වත්මන් නෛතික තත්ත්වය නිවැරදිව පිළිබිඹු වන්නේ දැයි සාකච්ඡා කරන්න.

02. තිලකසිරි හා පද්මා සාමාන්‍ය නීතියෙන් පාලනය වූවෝ වෙති. තිලකසිරිගේ වයස 21 ක් හා පද්මාගේ වයස වයස 17 ක් වූ 1997 දී ඔවුන්ගේ දෙමාපියෝ ඔවුන්ගේ විවාහය සූදානම් කළහ. පවුල් දෙකෙහි සාමාජිකයන් හා ඔවුන්ගේ මිතුරන් ඉදිරියේ පෝරුවේ චාරිත්‍ර පවත්වන ලදී. ඉන්පසු තිලකසිරි හා පත්මා තිලකසිරි විසින් කුලියට ගන්නා ලද නිවසක අඹු සැමියන් වශයෙන් ජීවත් වූහ. තිලකසිරි 1998 දී ව්‍යාපාරයක් ආරම්භ කළ අතර කෙටි කාලයක් තුලදී ධනවත් ව්‍යාපාරිකයෙක් බවට පත් විය.

2003 දී තිලකසිරි හදිසි අනතුරකින් මිය ගියේය. තිලකසිරිගේ එකම උරුමකරු තමා බව පවසමින් තිලකසිරිගේ සොහොයුරා තිලකසිරිගේ දේපලවලට උරුමය ඉල්ලමින් නඩුවක් පවරා ඇති බව පසුව පත්මාට දැන ගන්නට ලැබිණි. වත්මන් නීතිය අනුව සිය සැමියාගේ අන්තිම කැමති පත්‍රයක් රහිත දේපලවලට අනුප්‍රාප්තිය ලැබීමට භාර්යාවකට හැකි වන්නේ ඇය ඔහුගේ නීත්‍යානුකූල භාර්යාව වන්නේ නම් පමණි. තම විවාහයේ වලංගු භාවය සම්බන්ධයෙන් පත්මා ඔබේ උපදෙස් පතයි.

(අ) අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන හා නඩු තීන්දු ඇසුරෙන් පත්මාට උපදෙස් දෙන්න.

(ආ) තිලකසිරි හා පත්මා උඩරටියන් වූයේ නම් හා ඔවුන්ගේ විවාහය උඩරට විවාහ හා දික්කසාද පණත යටතේ ලියාපදිංචි කර තිබුනේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද?

- හිමිකම් ඇවිරිණි. -